**<u>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය</u>**

**<u>ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) සඳහා ව්‍යාපෘති කාර්යය මණ්ඩලය බඳවා ගැනීම</u>**

## 01. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) ලෝක බැංකුවේ (WB) ණය ආධාරයක්, යුරෝපා සංගමයේ ප්‍රදානයක් සහ ශ්‍රී ලංකා රජයේ මූල්‍යාධාර මගින් මූලනයවී ඇත. ව්‍යාපෘති අරමුණු පළාත් පාලන ආයතනවල හැකියාව ශක්තිමත් කර පළාත් පාලන සේවා වගවීමෙන් හා වගකීමෙන් යුතුව ජනතාවට ලබාදීම, ව්‍යාපෘති බල ප්‍රදේශයේ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනයට සහාය වීම හා අර්බුද හෝ සෞඛ්‍ය හදිසි ආපදා අවස්ථාවලට කඩිනම් හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම වේ. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 100.84කි. ව්‍යාපෘති කාලය 2019.06.30 සිට 2023.07.31 දක්වා වේ. මෙම ව්‍යාපෘතිය මඟින් උතුර, නැගෙනහිර, උතුරු මැද සහ ඌව පළාත්වල පළාත් පාලන ආයතන 134ක් ආවරණය කරනු ලබයි.

ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය (PCU) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ (නො. 330, යූනියන් පෙදෙස, කොළඹ 02 ) ස්ථාපිත කර තිබෙන අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයන් (PIU) 04ක් උතුර, නැගෙනහිර, උතුරු මැද සහ ඌව පළාත්වල ස්ථාපිත කර ඇත.

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ (PCU) පහත සඳහන් පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ ස්ථිර කළ, ඒ සඳහා සුදුසුකම් සපුරන හා යෝග්‍ය නිළධාරීන්ගෙන් අයඳුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් මට්ටම |
|---|---|---|---|
| 1 | සහකාර අධ්‍යක්ෂ (අධීක්ෂණ සහ ඇගයීම්) | 01 | PS 4 -A |
| 2 | සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | 01 | PS 4 -A |
| 3 | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය කළමනාකරණය) | 01 | PS 4 - A |

## 02. ඉහත තනතුරු සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද.

- අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද

**I** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක්

හෝ

අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීමය සුදුසුකමක්

සමඟ

අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වර්ෂ 08ක පූර්ව සුදුසුකම් පලපුරුද්ද

II. රජයේ දීප ව්‍යාප්ත සේවා වල III/II පන්තියේ නිළධාරීයෙක් වීම හෝ ඊට වැඩි හෝ අදාල ක්ෂේත්‍රයේ සමාන තත්වයක් තිබීම

සමඟ

III/II පන්තියේ තනතුරක අවම වශයෙන් වර්ෂ 08ක පළපුරුද්ද තිබීම

**සාමාන්‍ය කොන්දේසි**

- ශ්‍රී ලාංකික පුරවැසියන් පමණක් ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.
- විදේශ ව්‍යාපෘතිවල අත්දැකීම් සහිත අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලබයි.
- **තෝරාගැනීමේ ක්‍රමය -** සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කළ අයදුම්පත් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි.
- **වයස -** අයදුම්පත් බාර ගන්නා අවසාන වන දිනට වයස අවු. 60ට අඩු විය යුතුය.
- **රැකියා කොන්දේසි -** සියලු පත්වීම් වැඩ බැලීම් පදනමින් වන අතර කාලය 2023.07.31 දක්වා වේ. ඒ සමග ඔහුගේ /ඇයගේ නිත්‍ය තනතුරු වල සේවයේ යෙදිය යුතු වේ. ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීම, සතුටුදායක කාර්යයසාධනය මත පත්වීම්වල සේවා කාලය දීර්ඝ කරනු ලැබේ.
- අයදුම්කරුවන් තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුවේ.
- මේ සම්බන්ධයෙන් කැමැත්තක් දක්වන අයදුම්කරුවන් තම ජීව දත්ත ප්‍රකාශය (CV) අදාල අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුදු සහතිකපත් වල පිටපත් සමඟ ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නො. 330 යූනියන් පෙදෙස, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ projects.recruitment@pclg.gov.lk යන විද්‍යුත් ලිපිනයට 2023 ජනවාරි මස 30 වන දින පස්වරු 3.00ට පෙර එවිය යුතුවේ.
- තනතුරු නාමය සහ ව්‍යාපෘතියේ නම ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ සඳහන් කරන්න.
- ඔබ එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම් එක් එක් තනතුරු සඳහා වෙනම අයදුම්පත් ඉදිරිපත් කරන්න.
- අසම්පූර්ණ අයදුම්පත්, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වල සහතිකවල තොරතුරු හා නොගැලපෙන අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු.:** තනතුරුවලට අදාළ සුදුසුකම්, පළපුරුද්ද හා වැටුප් සම්බන්ධ තොරතුරු හා වෙනත් අමතර තොරතුරු සඳහා කරුණාකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක. 01/2019 චක්‍රලේඛය සහ අමාත්‍යාංශ වෙබ් අඩවිය www.mpclg.gov.lk බලන්න.

ලේකම්
**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

2023.01.20